*Archaeologia (2004) : 1 - 14*

# පුරාණ ලක්දිව මැණික් කර්මාන්තය

**මාලිංග අමරසිංහ**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## හැඳින්වීම

බොහෝ අතීත කාලවල පවා විසූ ජනතාව මැණික් පිළිබඳව දැන සිටියහ. මැණික්වල ඇති වටිනාකමත් ඉන් ලැබිය හැකි ඵල ප්‍රයෝජනත් හඳුනාගත් ඔවුහු තම ජීවිතයේ වැදගත් කාර්යයන් හමුවේ මැණික් භාවිතයට ගත්හ. පුරාණතම අවධිවල පවා මිනිසුන් සිය අපල දුරු කර ගැනීම් වස් මැණික් පැළඳීමට පුරුදුව සිටි අතර මේ කාර්යය වර්තමානය දක්වාම පැවතීම එවැනි විශ්වාසයන්ගේ තීව්‍රත්වය මැනවින් තහවුරු කරයි. බොහෝවිට කෙනෙකු ගේ උපන් මාසයට නියම වූ මැණික් පැළඳීම වර්තමානයේ සිරිත වී ඇති අතර ඇතැම් ලෙඩ රෝග සඳහා ද ඒවාට ගැලපෙන මැණික් පළඳනු ලැබේ. මැණික්වල සතරභූත වස්තූන් ඇතුළත්ව ඇතැයි ද විශ්වාස කරනු ලබයි.

## ඓතිහාසික පසුබිම

ඛනිජ වර්ගයක් වශයෙන් පොළොවෙන් ලබා ගන්නා මැණික් පොදු ජනතාව අතර ජනප්‍රිය වුවත්, අතීතයේ දී මැණික් භාවිත කරනු ලැබුවේ රජවරුන් විසින් පමණකි. තමන්ගේ ධනවත්කම පෙන්වීම සඳහාත්, තම ආභරණ සහ පැළඳුම් අලංකාර කර ගැනීම සඳහාත් රජවරුන් මැණික් භාවිත කරනු ලැබීය. මේ නිසාම රාජකීය භාණ්ඩාගාරවල මැණික් පුරවා තැබීමට ලොව බොහෝ රජවරු වගබලා ගත්හ.

ජනප්‍රවාදවල එන විස්තරවලට අනුව ඇතැම් නාගයන් සතුව මැණික් තිබූ බව සඳහන් වෙයි. බොහෝවිට බෞද්ධ සාහිත්‍යයේ ඇති කථා ප්‍රවෘත්තීන් තුළට මැණික් හිමිව සිටි නාගයන් පිළිබඳ විස්තර ඇතුළත් කර තිබේ. විනය පිටකයේ කුටිකාර ශික්ෂා පදයෙහි දක්වෙන කථාවකට අනුව අනගි මිණි රුවනක් ඇති මණිකණ්ඨ නම් නාගයකු පිළිබඳ ව සඳහනක් එයි. වර්තමානයේ පවා ලක්දිව බොහෝ ගැමියන් විසින් නාගයන් සතුව කණ්ඨ මාණික්‍යයක් ඇතැයි විශ්වාස කරනු ලබයි.

ක්‍රි. ව. 6 වන සියවසේ දී ලක්දිව විසූ නා රජවරු දෙදෙනෙක් වන චූලෝදර සහ මහෝදර අතර මැණික් පුටුවක් අරභයා ඇති වූ කලහයක් සංසිඳවීමට බුදුරජාණන්